සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 81 S I

අමතර කියවීමේ කාලය - මිනිත්තු 10 යි | කෘෂි හා ආහාර තාක්ෂණය | කාලය පැය තුනයි

අමතර කියවීමේ කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

සැලකිය යුතුයි :- ● සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
● අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගන්න.
● ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.● පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

01. එක් වැවක පෝෂක ප්‍රදේශය, අනෙක් වැවේ පෝෂක ප්‍රදේශය වන ලෙස වැව් පද්ධතිය සැකසීම හඳුන්වනු ලබන්නේ,
1. වැව් ඉස්මත්ත ලෙස ය. 2. බිසෝ කොටුව ලෙස ය.
3. එල්ලංගාව ලෙස ය. 4. යැපුම් කෘෂිකර්මාන්තය ලෙස ය.

02. පෘතුගීසි හා ලන්දේසි යුගයේ හඳුන්වාදුන් බෝග යුගලය වන්නේ,
1. පොල් හා රඹුටන් ය. 2. අඹ සහ අන්නාසි ය.
3. රඹුටන් හා දූරියන් ය. 4. පැපොල් හා අන්නාසි ය.

03. මෑත ඉතිහාසයේ කෘෂිකර්මාන්තය සම්බන්ධ සිදු වූ වෙනස්කම් කිහිපයක් පහත දක්වේ.
A - ගොවිපල යාන්ත්‍රීකරණය වැඩි වීම. B - බහු කාර්යය යෝජනා ක්‍රම ආරම්භය.
C - වැඩි අස්වනු සහිත බීජ හඳුන්වාදීම.

ඉහත කරුණු අතරින් හරිත විප්ලවය නිසා සිදු වූ වෙනස්කමක් වනුයේ,
1. A හා B පමණි. 2. A හා C පමණි. 3. B හා C පමණි. 4. A පමණි.

04. ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයක් වනුයේ,
1. ආහාර සුලභතාවය යි. 2. ආහාර නිෂ්පාදනය වැඩි කිරීම ය.
3. ආහාර ආනයනය යි. 4. ආහාර අපනයනය යි.

05. වර්ෂාපතනය මනිනු ලබන සම්මත ඒකකය වනුයේ,
1. මිලි ලීටර් ය. 2. සෙන්ටි මීටර් ය. 3. මිලි මීටර් ය. 4. ඝන සෙන්ටිමීටර් ය.

ප්‍රශ්න අංක 06 ට පිළිතුරු සැපයීම සඳහා පහත ආර්ද්‍රතාවගුව භාවිත කරන්න.

උෂ්ණත්වමාන පාඨාංක වෙනස

වියළි බල්බ පාඨාංකය

^0C	.5	1	1.5	2	2.5
25	96	92	88	84	81
26	96	92	88	85	81
27	96	92	89	85	82
28	96	93	89	86	82

06. යම් අවස්ථාවක වියළි බල්බ හා තෙත් බල්බ උෂ්ණත්ව මාන පාඨාංක වලින් 27^0ක හා 25^0ක නම් එම අවස්ථාවේ සාපේක්ෂ ආර්ද්‍රතාව වනුයේ,
1. 96% 2. 88% 3. 84% 4. 85%

07. වියළි කලාපයේ යල කන්නයට අදාළව වී වගාව සඳහා බිම් සැකසීමට යෝග්‍යම කාලය වනුයේ,
1. මැයි සිට සැප්තැම්බර් 2. මාර්තු සිට අප්‍රේල්
3. දෙසැම්බර් සිට ජනවාරි 4. ඔක්තෝබර් සිට නොවැම්බර්

08. උෂ්ණත්වය හා ප්‍රභාසංස්ලේෂණ සීඝ්‍රතාවය අතර සම්බන්ධතාවය නිවැරදිව දක්වා ඇති ප්‍රස්තාරය වනුයේ,



09. ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප සංඛ්‍යාව වනුයේ,
1. 46 කි. 2. 24 කි. 3. 3 කි. 4. 7 කි.

10. පස පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - ජල වහනය දුර්වල විට රතු පැහැ ගැන්වේ. C - සෝඩියම් වැඩි වීමෙන් පස ක්ෂාරීය වේ.
B - යකඩ අධික පස් රතු පැහැ ගැන්වේ. D - පාංශු ජලය හා වාතය අතර සම්බන්ධය අනුලෝම වේ.

මෙයින් නිවැරදි ප්‍රකාශය වනුයේ,
1. A හා B පමණි. 2 B හා D පමණි. 3. B හා C පමණි. 4. C හා D පමණි.

11. රතු කහ පොඩ්සොලික් පස දැකිය හැකි දිස්ත්‍රික්කය වනුයේ,
1. කෑගල්ල හා අනුරාධපුර ය. 2. මහනුවර හා මොණරාගල ය.
3. මොණරාගල හා කෑගල්ල ය. 4. කෑගල්ල හා මහනුවර ය.

12. ලෝම පසක,
1. කාබනික ද්‍රව්‍ය අධිකව පවතී. 2. වැලි මැටි රොන්මඩ සමානව පවතී.
3. ක්ෂුද්‍ර ජීවීන් වර්ධනය හොඳින් පවතී. 4. කේෂාකර්ෂණ ජලය අඩුවෙන් පවතී.

13. බෝග ශාකවලට යකඩ විෂවීම දැකිය හැකි වනුයේ,
1. පසේ ක්ෂාරීයතාවය වැඩි වූ විට ය. 2. පසේ ජලවහනය දුර්වල වූ විට ය.
3. පස ජලයෙන් සංතෘප්ත වූ විට ය. 4. පසේ ආම්ලිකතාවය වැඩි වූ විට ය.

14. පාංශු ඛාදනය වැඩි වීම සඳහා බලපාන සාධකයක් වනුයේ,
1. පසට කාබනික ද්‍රව්‍ය එක්වීම ය. 2. පසේ කාන්දු වීම :ෂබසෙකඑර්එසදබ* අවම වීම ය.
3. බිංදු ජල සම්පාදනය යොදා ගැනීම ය. 4. පසේ කාන්දුවීම් :ෂබසෙකඑර්එසදබ* උපරිම වීම ය.

15. මිරිස් වගාවෙන් පසු වල් පැල මර්ධනය සාර්ථකව සිදු කිරීමට වගා කළ හැකි බෝග කුලයක් වනුයේ,
1. පොඒසියේ 2. කුකර්බිටේසියේ 3. කොන්වොල්වුලේසියේ 4. රූටේසියේ

16. විද්‍යාත්මක බෝග වර්ගීකරණය වඩාත් හොඳින් විස්තර කර ඇති අනුපිළිවල වනුයේ,
1. කුලය ඣ ගණය ඣ විශේෂය ඣ ගෝත්‍රය 2. කුලය ඣ ගණය ඣ විශේෂය ඣ ප්‍රභේදය
3. ගණය ඣ කුලය ඣ ප්‍රභේදය ඣ විශේෂය 4. කුලය ඣ ගණය ඣ ප්‍රභේදය ඣ විශේෂය

17. දෙපේළි ක්‍රමයට වගාව සඳහා සුදුසු බෝගයක් වනුයේ,
1. අන්නාසි 2. කෙසෙල් 3. දොඩම් 4. බඩ ඉරිඟු

18. වී වගාවේ වල් මර්ධනය සඳහා වඩාත් යෝග්‍ය උපකරණය වනුයේ,
1. ස්විස් හෝව 2. තුන් පුරුක් කල්ටිවේටරය 3. ඇණ දත්ත පෝරුව 4. ජපන් රොටරි වීඩරය

19. ප්‍රාථමික මෙන්ම ද්විතික බිම් සැකසීම සඳහා යොදා ගත හැකි යන්ත්‍ර මගින් ක්‍රියාකරන බිම් සැකසීමේ උපකරණයක් වනුයේ,
1. තැටි නගුල ය. 2. කොකු නගුල ය. 3. උදැල්ල ය. 4. රිජරය ය.

20. තැටි නගුල යොදා ගැනීමෙන් වඩාත් ප්‍රතිඵලදායී වනුයේ,
1. ඇලි වැටි ක්ෂේත්‍රයේ සැකසීමට අවශ්‍ය අවස්ථාවලට ය.
2. පස දැඩි තත්ත්වයේ පවතින විට ය.
3. සාපේක්ෂව කුඩා මඩ ඉඩම් සඳහා ය.
4. බිංදු ජල සම්පාදනය සඳහා ක්ෂේත්‍රය සකසා ගතයුතු අවස්ථා සඳහා ය.

21. වර්ෂාපතනය අධික ජලවහනය දුර්වල ක්ෂේත්‍ර සඳහා වඩාත් යෝග්‍ය වන්නේ,
1. උස් වූ පාත්ති තවාන් ය. 2. ගිල් වූ පාත්ති තවාන් ය.
3. ඩැපොග් තවාන් ය. 4. නොරිඩොකෝ තවාන්ය.

22. තවාන් පාත්තියක බීජ ස්ථාපනය කරන ගැඹුර තීරණය කරනුයේ,
1. පසේ වයනය මත ය. 2. ජලය සම්පාදනය සිදු කරන ක්‍රමය මත ය.
3. බීජය ප්‍රරෝහණයවන ක්‍රමය මත ය. 4. බීජයේ විශාලත්වය මත ය.

23. නොරිඩෝකෝ තවාන් වඩාත් යෝග්‍ය වන්නේ,
1. අපනයන සඳහා සකසන පැල සඳහා ය. 2. අධික මිල සහිත බීජ සඳහා ය.
3. උදුරා සිටුවීමේ ආතතියට ඔරොත්තු දෙන පැල සඳහා ය. 4.හරිතාගාරය තුළ වගා කිරීමට සකසන පැල සඳහා ය.

24. ගිනි තැබීම මගින් ජීවාණුහරණය පිළිබඳ සත්‍ය ප්‍රකාශය වනුයේ,
1. ගිනි තැබීමට පෙර පස වියළිව පවත්වා ගත යුතුය. 2. සුළං හමන දිශාවට විරුද්ධ දිශාවට ගිනි තැබීම.
3. සුළං හමන දිශාවට ගිනි තැබීම සිදු කළ යුතුය. 4. ගිනි තැබීමෙන් පසු ජල සම්පාදනය කළ යුතුය.

25. ඇලි වැටි ජල සම්පාදනයේ ඇති අවාසියක් වනුයේ,
1. ඉඩමෙන් 50% ජල සම්පාදනය සඳහා වැය වීම ය. 2. සොලනේසියේ කුලයේ බෝගවලට වඩාත් යෝග්‍ය වීම ය.
3. උසස් තාක්ෂණික දැනුමක් අවශ්‍ය වීම ය. 4.ඕනෑම වයනයක් සහිත පසකට යොදාගත හැකි වීම ය.

ප්‍රශ්න අංක 26 - 27 දක්වා පිළිතුරු සැපයීමට පහත වගුව උපයෝගී කර ගන්න.

ජල සම්පාදන ක්‍රමය	ලක්ෂණය
A	තීරු ලෙස පාත්ති සකස් කිරීම.
B	වියළි කලාපයේ රතුළුණු වගාවට යොදා ගනී.
C	වැලි අධික පස් සඳහා නුසුදුසු වේ.
D	ජලය හිඟ වැලි සහිත ප්‍රදේශ සඳහා සුදුසු වේ.

ප්‍රශ්න අංක 26 - 27 දක්වා පිළිතුරු සැපයීමට පහත වගුව උපයෝගී කර ගන්න.

26. A ක්‍රමය යටතේ වගා කිරීමට සුදුසු බෝග ශාක යුගලයක් වනුයේ,
1. රතුළුණු හා වී 2. අර්තාපල් හා රටකජු 3. කෙසෙල් හා දොඩම් 4. සෝයා බෝංචි හා කවුපි

27. B ක්‍රමය වඩාත් උචිත වනුයේ,
1. තීරු ජල සම්පාදනය යි. 2. ඇලි වැටි ජල සම්පාදනය යි.
3. බේසම් ජල සම්පාදනය යි. 4. පිටාර ජල සම්පාදනය යි.

28. රළු වයනයක් සහිත පසක බෝග වගාවකට ජල සම්පාදනය කිරීමේ දී,
1. ජල සම්පාදන කාලාන්තරය වැඩි කළ යුතුය. 2. ජල සම්පාදන කාලාන්තරය අඩු කළ යුතුය.
3. ජල සම්පාදන ප්‍රමාණය අඩු කළ යුතුය. 4. ජල සම්පාදන ප්‍රමාණය වැඩි කළ යුතුය.

29. දුර්වල වර්ධනයක් සහිත ගොටුකොල ශාකයක් පරීක්ෂාවේ දී මුල්වල ගැටිති දැකිය හැකි විය. මෙම තත්ත්වය පාලනයට යෙදිය හැකි උපක්‍රමයක් වනුයේ,
1. වෛරස් තොර රෝපණ ද්‍රව්‍ය භාවිතය. 2. වාහක කෘමීන් පාලනය.
3. බෝග මාරුව. 4. නිර්දේශිත පොහොර වර්ග භාවිතය.

30. පහත රූපයේ පෙන්වා ඇත්තේ රෝග ත්‍රිකෝණය යි. මෙහි'ල ඊ හා ක පිළිවෙලින්,
1. වෛරස, හිතකර පරිසර හා රෝග කාරකයා ය.
2. රෝග කාරකයා, අහිතකර පරිසරය හා දේශගුණය.
3. දේශගුණය, හිතකර පරිසරය හා ධාරකයා.
4. රෝග කාරකයා, ධාරක ශාකය හා හිතකර පරිසරය ය.



31. තවාන් පැළවලට බහුලව වැළඳෙන දිලීර රෝගයක් වනුයේ,
1. ඇන්ත්‍රැක්නෝස් ය. 2. හිටුමැරීම ය. 3. දියමලන් කෑම ය. 4. මුල් ගැට රෝගය ය.

32. භූගත කඳන් සහිත වල් මර්ධනය සඳහා යෝග්‍ය වල්නාශක කාණ්ඩය වනුයේ,
1. පරිසර්පන වල්නාශක ය. 2. ස්පර්ශ වල්නාශක ය.
3. පූර්ව නිර්ගමන වල්නාශක ය. 4. වටපනු නාශක ය.

33. අවුලකපෝරා කුරුමිණියාගේ කීටයා ප්‍රධාන වශයෙන් හානි කරනුයේ,
1. පත්‍ර ය. 2. ඵල ය. 3. මුල් ය. 4. කඳ ය.

34. පලතුරු මැස්සා පාලනයට භාවිතා කරන උගුල සඳහා යොදා ගනු ලබන රසායනිකය වනුයේ,

1. මෙටැල්ඩිහයිට් ය. 2. කියුලින් ය. 3. මීතයිල් ඉයුජිනෝල් ය. 4. ඇකරිනාශකයන් ය.

35. වී ශාකයේ අවසන් පත්‍රය හඳුන්වනු ලබන්නේ,

1. ජිහ්වලය ලෙස ය. 2. පත්‍ර තලය ලෙස ය. 3. කර්ණිකාව ලෙස ය. 4. ධජ පත්‍රය.

36. වර්තමානයේ වී තවාන් තැටි තුළ රෝපණය කර ක්ෂේත්‍රයේ ස්ථාපනය කිරීම හඳුන්වනු ලබන්නේ,

1. පැරෂුට් ක්‍රමය ලෙස ය. 2. ඩැපොක් ක්‍රමය ලෙස ය.

3. වප්කර ක්‍රමය ලෙස ය. 4. බී ජෞෂණය ලෙස ය.

37. වී අස්වනු නෙලීමට හොඳම අවස්ථාව වනුයේ,

1. බීජ තෙතමනය 12 - 13% පමණ වූ විට ය. 2. බීජ 85% රන්වන් පැහැය වූ විට ය.

3. වර්ග පවිත්‍රතාවය 98% වූ විට ය. 4. ජල සම්පාදනය නවතා සති 2 වූ විට ය.

38. වෙළඳපොළේ මිලදී ගත හැකි බණ්ඩි පොහොර යෙදීමෙන් පසට ලැබෙනුයේ,

1. හ හා ෂ ය. 2. හ හා ණ ය. 3. ෂ හා ණ ය. 4. හල ෂ හා ණ ය.

39. කොම්පෝස්ට් නිෂ්පාදනයේ දී කිකිළියන්ගේ ආස්තරණය හා පිදුරු යෙදීමෙන් බලාපොරොත්තු වනුයේ පිළිවෙලින්,

1. N හා P වැඩි කිරීමයි. 2. N හා K වැඩි කිරීමයි.

3. N හා K වැඩි කිරීමයි. 4. P හා K වැඩි කිරීමයි.

40. බෝග වර්ධනයට අදාළ පෝෂක පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.

1. වර්ධක අවස්ථාවේ වැඩිපුර ෂ අවශ්‍ය අතර ප්‍රජනක අවධියේ ණ අවශ්‍ය වේ.
2. වර්ධක අවධියේ වැඩි පුර හ අවශ්‍ය අතර, ප්‍රජනක අවධියේ ෂ අවශ්‍ය වේ.
3. සෑම අවස්ථාවකම පෝෂක සමානව අවශ්‍ය වේ.
4. වර්ධක අවධියේ දී හ වැඩිපුර අවශ්‍ය අතර, ප්‍රජනක අවධියේ දී ණ වැඩිපුර අවශ්‍ය වේ.

කොටස - II

01. අතීතයේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු වර්ෂාපතනයේ රටාව පදනම් කර ගනිමින් ගොඩනැගී ඇත. විශේෂයෙන් යල සහ මහ ලෙස ප්‍රධාන කන්න දෙකක් පවතී. අධික වර්ෂාව නිසා පාංශුඛාදනනය සිදුවීමේ අවධානම වැඩි වේ.

i. a) මහ කන්නය ලෙස හඳුන්වන කාල වකවානුව සඳහන් කරන්න.

b) සංවහන වැසි පවතින කාලවල දැකිය හැකි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

ii. a) පාංශු ඛාදනය යනු කුමක් ද?

b) පාංශු ඛාදනයේ අහිතකර ප්‍රතිඵල දෙකක් සඳහන් කරන්න.

iii. බැක්ටීරියා රෝගවල පොදු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

iv. වී වගාවේ වැපිරීමට සාපේක්ෂව පැළ සිටුවීමේ වාසි දෙකක් සඳහන් කරන්න.

v. ජලවහනය දුර්වල වීමෙන් ඇතිවන ගැටළු දෙකක් සඳහන් කරන්න.

vi. පළිබෝධ පාලනය සඳහා නිර්දේශිත රසායනික නොවන පළිබෝධනාශක දෙකක් සඳහන් කරන්න.

vii. තවානක පැළ දැඩි කිරීමේ දී සිදුකරනු ලබන ක්‍රියාවන් දෙකක් ලියන්න.

viii. උප පෘෂ්ඨීය ජල සම්පාදනයේ අවාසි දෙකක් ලියන්න.

ix. ධාන්‍ය බෝග සඳහා උදාහරණ දෙකක් ලියන්න.

x. බිම් සැකසීමේ දී දියුණුවන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.



02. කෘෂි කාලගුණික ඒකකයක් පරීක්ෂා කිරීමේ දී සුළං දිශා දර්ශකය රූපයේ පරිදි දිස්විය.

i. a) මෙම රූපයට අනුව සුළං හමන දිශාව සඳහන් කරන්න.

b) මෙම පාඨාංක ලබා ගත් දිනයේ පැවතිය හැකි මෝසම් වර්ෂාව කුමක් ද?

c) කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයේ වැදගත්කම් තුනක් සඳහන් කරන්න.

ii. බෝග වර්ගීකරණයේ වැදගත්කම් හතරක් ලියන්න.

iii. බෝග කුල පිළිබඳ දැනුමෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

පොඒසියේ	A	B ....
C	දෙහි	ඉඟුරු
වී	දොඩම්	D ....

03. බෝග වගාවේ දී අස්වනුවල ගුණාත්මය කෙරෙහි සෘජු ලෙසම පසේ ගුණාත්මය බලපායි.

i. a) පාංශු ව්‍යුහය අර්ථ දක්වන්න.

b) පාංශු ව්‍යුහය විනාශවන ආකාර තුනක් සඳහන් කරන්න.

ii. පාංශු ඛාදනය සිදුවන ආකාර හතරක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

iii. දර්ශීය පාංශු පැතිකඩක් ඇඳ ප්‍රධාන කොටස් නම් කරන්න.

04. බෝග වගාවේ දී පෝෂක ලබාදීමට කාබනික පොහොර මෙන්ම අකාබනික පොහොර ද ඉතා වැදගත් වේ.

i. a) රසායනික පොහොර යෙදීමෙන් ඇතිවන අහිතකර බලපෑම් හතරක් සඳහන් කරන්න.

b) ඒකාබන්ධ ශාක පෝෂක කළමනාකරණය හඳුන්වන්න.

c) බෝග ශාකවල N හිඟවීම නිසා ඇතිවිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.

ii. a) කෘෂිකර්මාන්තයේ දී කාබනික පොහොර යෙදීමේ වැදගත්කම් හතරක් සඳහන් කරන්න.

b) අකාබනික පොහොර භාවිතය සීමාවීමට බලපාන සාධක තුනක් ලියන්න.

iii. පහත රසායනික පොහොරවල අඩංගු ප්‍රධාන පෝෂක ප්‍රතිශතය සඳහන් කරන්න.

a) යූරියාවල (N)

b) ත්‍රිත්ව සුපර් පොස්පේට්වල (P_2O_5)

c) සල්ෆේට් ඔෆ් පොටෑෂ් වල (K_2O)

05. බෝග වගාව සඳහා සුදුසු ලෙස භෞතිකව පොළව සකස් කිරීම බිම් සැකසීමේ දී සිදු කරයි.

i. a) බිම් සැකසීමේ දී පළිබෝධ පාලනය සිදුවන ආකාර දෙකක් සඳහන් කරන්න.

b) විවිධ ට්‍රැක්ටරවල සවිකළ හැකි උපකරණ ඇසුරෙන් පහත වගුව පුරවන්න.

	ප්‍රාථමික බිම් සැකසීම	ද්විතික බිම් සැකසීම
සිවු රෝද ට්‍රැක්ටරය	....	....
ද්වි රෝද ට්‍රැක්ටරය	....	....

ii. අතුරුයත්ගෑමේ දී සිදු කරන ක්‍රියාකාරකම් හතරක් ලියන්න.

iii. a) බිංදු ජල සම්පාදනයේ වාසි හතරක් සඳහන් කරන්න.

b) පාංශු ජලය සංරක්ෂණය කළ හැකි ක්‍රම 04 ක් ලියන්න.

06. බෝග වගාවේ දී අපේක්ෂිත අස්වනු ඉලක්ක කරා ළඟා වීමට නොහැකි ප්‍රධානම හේතුවක් වනුයේ වල් පැළෑටි රෝග කාරක හා කෘමි පළිබෝධ ආදීන්ගෙන් ඇතිවන අහිතකර බලපෑම් ය.

i. a) රූපාන්තරණය ලෙස හඳුන්වන්නේ කුමක් ද?

b) පූර්ණ රූපාන්තරණයක් සහිත කෘමියෙකුගේ ජීවන චක්‍රයේ අවධි හතර සඳහන් කරන්න.

ii. a) වගා ක්ෂේත්‍රයකට රෝග කාරකයින් පිටතින් ඇතුළුවීම වැළැක්වීමට ගතහැකි උපක්‍රම හතරක් ලියන්න.

b) බෝගවලට වෛරස් රෝග බෝ කරන කෘමීන් දෙදෙනෙකු නම් කරන්න.

iii. a) වල් පැළෑටිවල දැකිය හැකි පොදු ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

b) තෘණ ශාක හා පන්වර්ග අතර කදෙහි දැකිය හැකි වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

07. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආහාරය සහල් බැවින් රජය විසින් වී වගාව සඳහා අනුග්‍රහය අනෙක් බෝග වලට වඩා ලබාදෙයි.

i. a) ශ්‍රී ලංකාවේ වගා කරන සාම්ප්‍රදායික වී ප්‍රභේද දෙකක් නම් කරන්න.

b) වැඩි දියුණු කළ වී ප්‍රභේද සතු ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

ii. වී වගාවේ සකසනු ලබන තවාන් වර්ග තුන නම් කර ඉන් අඩුම ඉඩක් අවශ්‍ය තවන් ක්‍රමය විස්තර කරන්න.

iii. a) තවානක් සඳහා සුදුසු ස්ථානයක් තේරීමේ දී සැලකිය යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

b) තවානක් භාවිතා කිරීමේ වාසි දෙකක් ලියන්න.

තෙවන වාර පරීක්ෂණය - 2019

කෘෂි හා ආහාර තාක්ෂණය

11 ශ්‍රේණිය

පිළිතුරු පත්‍රය-1

01.	-	3	11.	-	4	21.	-	1	31.	-	2
02.	-	4	12.	-	2	22.	-	4	32.	-	1
03.	-	2	13.	-	4	23.	-	3	33.	-	3
04.	-	1	14.	-	2	24.	-	2	34.	-	1
05.	-	3	15.	-	3	25.	-	1	35.	-	4
06.	-	4	16.	-	2	26.	-	4	36.	-	1
07.	-	2	17.	-	1	27.	-	3	37.	-	2
08.	-	1	18.	-	4	28.	-	2	38.	-	2
09.	-	4	19.	-	2	29.	-	3	39.	-	4
10.	-	3	20.	-	2	30.	-	4	40.	-	4

පිළිතුරු පත්‍රය-11

01. i. a) පළමු අන්තර් මෝසමේ සිට නිරිතදිග මෝසම අවසානය තෙක් / මාර්තු අප්‍රේල් සිට සැප්තැම්බර්.

b) උදෑසන පැහැදිලි අහස / මධ්‍යහනය වන විට අහස වලාකුළින් බර වීම / ප. ව. දෙකට පමණ ගිගුරුම් සහිත වැසි / මධ්‍යම කඳුකරයෙන් පටන් ගෙන වෙරළබඩ දක්වා පැතිරීම ආදී පිළිතුරු

ii. a) යම් ස්ථානයක පිහිටි පස් පාංශු සමූහන හෝ අංශු ලෙස පාංශු දේහයෙන් වෙන් වී වෙනත් ස්ථානයක් වෙත ගසාගෙන ගොස් තැන්පත් වීමේ ක්‍රියාවලියයි.

b) ශාක ඇඳ වැටීම / පසේ පෝෂක හිඟ වීම / කෘෂිකාර්මික ඉඩම්වල වටිනාකම අඩු වීම / පාංශු ස්ථරයේ ඝනකම අඩවීම නිසා උපස්තරය හිඟ වීම.

iii. පුල්ලි ඇති වීම / ගැටිති ඇති වීම/ මැලවීම / අංගමාරය / පුල්ලි ඇති වීම

iv. අවශ්‍ය බීජ ප්‍රමාණය අඩු ය. / සියුම්ව සකස් කිරීම අවශ්‍ය නොවේ. අවශ්‍ය ජල ප්‍රමාණය අඩු ය. / වල්පැල පාලනය පහසුය.

v. පාංශු වාතය දුර්වල වීම / විෂ වායු නිපදවීම / පසේ ලවණතාවය වැඩි වීම / මුල් කුණු වීම / කෘෂි උපකරණ භාවිතයේ ගැටළු ඇති වීම / පාංශු රසායනික රක්ෂණ පිරිහීම / මුල් පොළොව මතුපිටට සීමා වීම / නියං ප්‍රතිරෝධීතාව අඩු වීම.

vi. සුදුළූණු සාරය / කොහොඹ ඇට සාරය / කොහොඹ තෙල් / කොච්චි සාරය / සුදුළූණු සාරය ආදී පිළිතුරු

vii. ජලය යොදන වාර ගණන අඩු වීම./ ජලය යොදන කාලාන්තර වැඩි කිරීම / ආලෝකයට නිරාවරණය කරන කාලය වැඩි වීම.

viii. මූලික වියදම වැඩි ය. / නල අවහිර විය හැක / ඵලවලට හානි සිදුවිය හැක.

ix. වී / කුරක්කන් / මෙනේරි

x. දෘෂ්‍ය ඝණත්වය / සච්චරතාවය / ජලවහනය

02. i. a) උතුරු දිශාවේ සිට දකුණට ලකුණු 1 × 1 = 1

b) ඊසාන දිග මෝසම ලකුණු 1/2 × 1 = 1/2

c) ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණ කටයුතු / වගා කටයුතු සැලසුම් කිරීම / කෘෂිකාර්මික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී / සාමාන්‍ය දේශගුණික තත්ත්ව සහිත ප්‍රදේශ හඳුනා ගැනීම. ලකුණු 1/2 × 3 = 1 1/2

ii. බිම් සැකසීමේ දී / පොහොර යෙදීමේ දී / රසායනික වල් නාශක භාවිතයේ දී / පලිබෝධ පාලනයේ දී ලකුණු 1 × 3 = 3

iii.

	රුටේසියේ A	සින්ජබරේසියේ B ....
බඩ ඉරිඟු / කුරක්කන් C		
		කහ D ....

ලකුණු 1 × 4 = 4

03. i. a) පස් අංශු එකට එක් වී සැදි සමූහනවල රූපාකාරය හෙවත් ස්වරූපය. ලකුණු 1 × 1 1/2 = 1 1/2

b) ජල වහනය දුර්වල වීම / පාංශු ඛාදනය අධික වීම / ජලවහනය දුර්වල වීම. ලකුණු 1/2 × 3 = 1 1/2

ii. විසිරි ඛාදනය / ස්ථරීය ඛාදනය / ඇලි ඛාදනය / ඇගිලි ඛාදනය / දියපහර ඛාදනය

ලකුණු - හතරක් නම් කිරීමට 1/2 × 4 = 2 + විස්තර කිරීමට 01 = ලකුණු 03

iii. 

0 ස්ථරය

A ස්ථරය / විශෝධන කලාපය

B ස්ථරය / සංචායක කලාපය

C ස්ථරය /මාතෘ ද්‍රව්‍ය

R ස්ථරය /මාතෘ පාෂාණ

රූපයේ සියළු කොටස් ඇඳීම හා නිවැරදිව නම් කිරීමට ලකුණු ලබා දෙන්න.

ලකුණු - ඇදීමට ලකුණු = 2 + කොටස් හතරක් නම් කිරීම සඳහා 1/2 × 4 = 2 = ලකුණු 04

04. i. a) පාංශු pH අගය බෝග වගාවට අහිතකර වීම / මිල අධික වීම / ගබඩා කිරීමේ ගැටළු/ ජල ප්‍රභව දූෂණය / ජෛව විවිධත්වයට හානි සිදුවීම ආදී කරුණු හතරක්. ලකුණු 1/2 × 4 = 2

b) කාබනික පොහොර යොදා පසේ භෞතික රසායනික හා ජෛවීය ලක්ෂණ සංවර්ධනය කර ගනිමින් බෝගයේ පෝෂණ අවශ්‍යතා සපිරින පරිදි රසායනික පොහොර යෙදීමයි. ලකුණු 1 × 1 = 1

c) මේරූ පත්‍ර කහ පැහැ වීම / වර්ධනය අඩු වී ශාක කුරු වීම / මල් හා ඵල විකෘති වීම / අස්වැන්න අඩු වීම. ලකුණු 1 × 2 = 2

ii. a) ශාකවලට අවශ්‍ය පෝෂක සැපයීම / රසායනික ලක්ෂණ දියුණු වීම / ස්වාරණයක් ලෙස ක්‍රියාත්මක වීම / පාංශු වයනය දියුණු වීම/ ජල ධාරිතාව වැඩි දියුණු වීම / පසේ ක්ෂුද්‍ර ජීවී ගහණය වැඩි වීම.

b) පෝෂක ප්‍රමාණය අඩු වීම / විශාල ප්‍රමාණ වලින් අවශ්‍ය වීම / සකසා ගැනීමේ අපහසුව / යෙදීමේ දී කම්කරු වියදම වැඩි වීම / ගබඩා කිරීමට වැඩි අඩක් අවශ්‍ය වීම. ලකුණු 1/2 × 4 = 2

ලකුණු 1/2 × 3 =1 1/2

iii. a) 46%

b) 45%

c) 48%

} ලකුණු 1/2 × 3 =1 1/2

05. i. a) මතුපිට වල් පැළෑටි පොළොවට යටවීම / භූගත වල් පැළෑටි කොටස් ඉවත් වීම / ඉපැනැලිවල පවතින කෘමි පළිබෝධ හා රෝග කාරක විනාශ වීම / පස තුළ සිටින රෝග පළිබෝධ බාහිරට නිරාවරණය වී විනාශ වීම. ලකුණු 1 × 2 = 2

b)

	....	....
	තැටි නගුල .... ජපන් පරිවර්තන නගුල	කොකු නගුල / තැටි පෝරුව .... රොටවේටරය

ලකුණු 1/2 × 4 = 2

ii. පස බුරුල් කිරීම / ගස් මුලට පස් දැමීම / පොහොර පස සමග කවලම් කිරීම / වල් පැල ගැලවීම

ලකුණු 1/2 × 4 = 2

iii. a) ජල සම්පාදන කාර්යක්ෂමතාව වැඩිය / ජලය අපතේ නොයාම / ජලය සමග පොහොර යෙදිය හැක / ස්වයංක්‍රීයව ක්‍රියාත්මක කළ හැක / ඕනෑම භූමියකට සුදුසුය. ලකුණු 1/2 × 4 = 2

b) පසට කාබනික ද්‍රව්‍ය එක් කිරීම / පසට වසුන් යෙදීම / වල් පැළෑටි ඉවත් කිරීම / අනවශ්‍ය අතු කපා ඉවත් කිරීම / මතුපිටින් ඉවතට ගලායන ජලයට බාධා කිරීම.

ලකුණු 1/2 × 4 = 2

06. i. a) කෘමි බිත්තර වලින් අංග සම්පූර්ණ නව කෘමීන් ඇති වීමේ ක්‍රියාවලියේ දී රූපීයව එකිනෙකට වෙනස් වූ අවධි කිහිපයක් පසු කිරීමේ ක්‍රියාවලිය යි. ලකුණු 2 × 1 = 2

b) බිත්තර, කීඩයා, පිලවා, සුහුඹුලා ලකුණු 1/2 × 4 = 2

ii. a) නිරෝගී රෝපණ ද්‍රව්‍ය භාවිත කිරීම / බීජ ප්‍රතිකාර කිරීම / රෝග වාහක පළිබෝධ කෘමීන් විනාශ කිරීම / අවම පරිසරයේ ඇති ධාරක වල් පැළෑටි විනාශ කිරීම / ආරක්ෂිත ගෘහ තුළ වගාකිරීම. ලකුණු 1/2 × 4 = 2

b) කුඩිත්තා / කීඩෑවා / සුදු මැස්සා / පැල මැක්කා / පිටි මකුණා ලකුණු 1/2 × 2 = 1

iii. a) සීඝ්‍රයෙන් පැතිරීම / විවිධ ක්‍රම මගින් පැතිරීම / ශක්තිමත් මූල මණ්ඩලය / ජීවන චක්‍රය කෙටි වීම / පළිබෝධ හානිවලට ඔරොත්තු දීම/ සීඝ්‍රයෙන් පැතිරීම ලකුණු 1/2 × 4 = 2

b) තෘණ ශාකවල කඳ සිලින්ඩරාකාර වන අතර, පත් වර්ග වල කඳ ත්‍රිකෝණාකාර වේ. තෘණ ශාකවල කඳ ඇතුළත කුහර සහිත වන අතර, පත්වර්ග වල ඇතුළතට කුහර නැත. ලකුණු 1/2 × 2 = 1

07. i. a) සුවඳැල් / කලු හී නැටි / කුරුළු තුඩු / රත්දැල් ලකුණු 1 × 2 = 2

b) ශාක මිටි වීම / පඳුරු දැමීම වැඩි / රසායනික පොහොරවලට ඉහළ ප්‍රතිචාරයක් දක්වයි. පත්‍ර කෙටි වීම හා පළල් වීම / අස්වනු වැඩි ආදිය. ලකුණු 1/2 × 4 = 2

ii. ඩැපොග් තවාන් / මඩ තවාන් හා තැටි තවාන් / ඩැපොග් තවාන් විස්තර කිරීම සඳහා ලකුණු ලබා දෙන්න.

ලකුණු නම් කිරීම 1/2 × 3 = 1 1/2 + විස්තර කිරීම 1 1/2 = ලකුණු 3

iii. a) සමතලා බිමක් වීම / ජලය ලබා ගැනීමේ හැකියාව / රෝගී වගාවක් නොතිබූ ස්ථානයක් වීම / හිරු එළිය හොඳින් ලැබෙන ස්ථානයක් වීම / ජලවහනය හොඳින් සිදුවන ස්ථානයක් වීම. ලකුණු 1/2 × 4 = 2

b) පැළ වලට ගැළපෙන ලෙස පරිසර තත්ත්ව පාලනය.

ශක්තිමත් හා නිරෝගී පැල වැඩි සංඛ්‍යාවක් නිපදවාගත හැක.

තවානකදී කුඩා පැළ ලබාගත හැක.

බද්ධ කිරීම සඳහා පැළ ලබාගත හැක.

ක්ෂේත්‍රයේ ඒකාකාරී වගාවක් පවත්වාගත හැක.

අවශ්‍ය බීජ ප්‍රමාණය අඩු වීම.

ලකුණු 1/2 × 2 = 1